# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


| | | |
|---|---|---|
| මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/4/4 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2020.09.21 |

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම විදුහල්පතිවරුන් වෙත,

## සමස්ත ලංකා පාසල් බටහිර සංගීත හා නැටුම් තරගය 2021
## චක්‍රලේඛ අංකය - 28/2020

අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව මගින් මෙරට සිසු දරු දැරියන් අතර බටහිර සංගීතය ප්‍රාසාංගිකව ප්‍රවර්ධනය කිරීමේ අරමුණ පෙරදැරි කරගනිමින් මෙම තරගාවලිය වාර්ෂිකව සංවිධානය කරනු ලැබේ.

**1.0 අරමුණු හා අභිමතාර්ථ**

1.1 පාසල් සිසුන්ට තම කුසලතාවයන් ප්‍රදර්ශනය කිරීමේ අවස්ථාවන් සැලසීම
1.2 ගුරුවරුන් හා සිසුන්ගේ නිර්මාණාත්මක හැකියාවන් ධෛර්යමත් කිරීම
1.3 සිසුන් එකිනෙකාගේ දක්ෂතාවයන් ඇගයීම හා උසස් සංගීත රසාස්වාදයන් වැඩිදියුණු කිරීම
1.4 සිසුන්ගේ පෞරුෂය හා නීතිගරුක භාවය වර්ධනය කිරීම

**2.0 පොදු කොන්දේසි**

2.1 මෙම තරගය දිවයිනේ සියලුම රජයේ පාසල් හා පෞද්ගලික පාසල්, හා ජාත්‍යන්තර පාසල් සඳහා විවෘත වේ.

2.2 රජයේ පත්වීමක් ලබා ඇති බටහිර සංගීත ගුරුවරයකු සේවයේ නියුතු සියලුම පාසල් මෙම තරගය සඳහා ඉදිරිපත්වීම අනිවාර්ය වේ.

2.3 අමාත්‍යාංශය මගින් පනවන ලද කොන්දේසි උල්ලංඝණය කරනු ලබන ඕනෑම පාසලක් තරගයෙන් ඉවත් කරනු ලැබේ.

2.4. සියලුම පාසල් පහත දක්වා ඇති අයුරින් වර්ගීකරණය කර ඇත

2.4.1 **A1** වර්ගය - සියලුම රජයේ අනුමත පෞද්ගලික පාසල් / ජාත්‍යන්තර පාසල්/ බාහිර වෘත්තීය උපදේශකයකු විසින් සිසුන් පුහුණු කරනු ලබන සියලුම රජයේ පාසල්

2.4.2 **A2** වර්ගය - බටහිර සංගීතය ගුරුවරයා හෝ එම පාසලේ වෙනත් ගුරුවරයකු විසින් පමණක් සිසුන් පුහුණු කිරීම සිදුකරන ජාතික පාසල් හා 1AB පාසල්

2.4.3.(අ)**B** වර්ගය - A1 හා A2 වර්ගයට අයත් නොවන අනෙකුත් රජයේ සියලුම පාසල්

2.4.3.(ආ) ඕනෑම රජයේ පාසලක බටහිර සංගීත විෂය ආරම්භකර වසර 05ක් තුළ ඔබේ කැමැත්ත පරිදි " **B** වර්ගය" යටතේ තරගයට ඉදිරිපත් විය හැක.

2.5 සංගීත ගුරුවරයාට හෝ පාසලේ ශිෂ්‍යයකු / ශිෂ්‍යාවකට සහාය වාදනය කිරීමට අවශ්‍ය අයිතම සඳහා, සහාය වාදනය කළ හැකි අතර ගුරුවරයාට මෙහෙයවීමට (Conduct) අවසර දෙනු නොලැබේ.

2.6. **B වර්ගය** සඳහා පමණක් සහාය වාදනය සඳහා පටිගත කරන ලද සංගීතය යොදාගත හැකිය.

2.7 සෑම අයිතමයක්ම ඉදිරිපත් කිරීම, වේදිකාවට පිවිසීම සහ පිටවීම ඇතුළුව කාලය විනාඩි 08කට සීමාවිය යුතු අතර ඉහත කාලය ඉක්මවූ අවස්ථාවලදී ලකුණු අඩු කිරීමක් සිදු වේ.

2.8 සියලුම සහභාගිවන සිසු සිසුවියන් පහත සඳහන් ඇඳුමින් සහභාගී විය යුතුය.

ගැහැණු - සුදු පැහැති, කොලරය සහිත, අත් කෙටි / දිග කමිසය සහ කලු සාය (දණහිසේ සිට අඟල් 01ක් පහළට දිග )හෝ කලු පැහැති දිගු කලිසම

පිරිමි - සුදු පැහැති, කොලරය සහිත අත් කෙටි / දිග කමිසය සහ දිග කලු පැහැති කලිසම

- සහභාගිවන සියලුම සිසුන් තම පාසලේ අනන්‍යතාවය පිළිබිඹු කරන කරපටි, බෝ හෝ වෙනත් අමතර පළඳනා භාවිතා කිරීමෙන් වැළකිය යුතුයි.

2.9 අවසන් වතාවට තරග පැවැත්වූ වර්ෂයේදී, ඒකල තරග ශීර්ෂ යටතේ පළමු ස්ථානය දිනාගත් තරගකරුවන් නැවත එම තරග ශීර්ෂය යටතේ ම තරග කිරීම සඳහා ඉදිරිපත් විය නොහැකි ය.

## 3.0 කණ්ඩායම්

| | | |
|---|---|---|
| 3.1 | ප්‍රාථමික | 1 ශ්‍රේණිය සිට 5 ශ්‍රේණිය |
| 3.2 | කණිෂ්ඨ | 6 ශ්‍රේණිය සිට 9 ශ්‍රේණිය |
| 3.3 | ජ්‍යෙෂ්ඨ | 9 ශ්‍රේණිය සිට 13 ශ්‍රේණිය |
| 3.4 | විවෘත | සියලුම වයස් කණ්ඩායම් |
| 3.5 | මිශ්‍ර | ගැහැණු සහ පිරිමි (කණ්ඩායම් ගායනය හෝ නර්තනය සඳහා පමණි) |

*** කණ්ඩායම් ගායන තරග සඳහා ( Choir) පමණක් 09 ශ්‍රේණියේ සිටින සිසුන්ට කණිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ කණ්ඩායම් දෙකින් එක් කණ්ඩායමකට පමණක් සහභාගී වීමට අවසර ඇත.**

## 4.0 අයිතම තෝරා ගැනීම

4.1 තරගයට ඉදිරිපත්වීමේදී ඒකල තරග අයිතමයන්ට වඩා කණ්ඩායම් තරග අයිතමයන් සඳහා ඉදිරිපත්වීම තුළින් සිසුන් වැඩි සංඛ්‍යාවකට සහභාගිවීම සඳහා අවස්ථාව සලසා දීම අනුමත කරමි.

4.2 පාසලක් සඳහා ඉදිරිපත් කළ හැකි අංග ප්‍රමාණය 05ක් වන අතර, එක් අයිතමයක් සඳහා එක් පාසලකින් එක් තරගකරුවෙක් / කණ්ඩායමක් පමණක් ඉදිරිපත් කළ යුතු වේ.

4.3 පහත සඳහන් පරිදි අයිතමයන් තෝරාගැනීම සිදුකළ යුතු ය.

| අයිතම ගණන | | ඒකල | කණ්ඩායම් |
|---|---|---|---|
| 01 | | | 01 |
| | හෝ | | |
| 02 | | 01 | 01 |
| | හෝ | | 02 |
| 03 | | | 03 |
| | හෝ | 01 | 02 |
| 04 | | 01 | 03 |
| | | | 04 |
| 05 | | 01 | 04 |
| | හෝ | 02 | 03 |
| | | | 05 |

4.4 පහත අයිතම සඳහා සහභාගී විය හැකි සිසුන් සංඛ්‍යාව

4.4.1. සමූහ ගායනය / රෙකෝඩර් / මෙලෝඩිකා / පර්කෂන් බැන්ඩ මිශ්‍ර වාද්‍ය භාණ්ඩ : අවමය 15 - උපරිම 35

4.4.2. පියානෝ එකෝඩියන් / ගිටාර් (**Classical Style**) : අවමය 05 - උපරිම 25

4.4.3 චේම්බර් කණ්ඩායම් (කුඩා වාද්‍ය කණ්ඩායම්) : අවමය 04 - උපරිම 08

4.4.4. ඔකෙස්ට්‍රා / වින්ඩ් බැන්ඩ : අවමය 20 - උපරිම 40

## 5.0 තරගය

**අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය පරිශීලනය මගින් පහත තොරතුරු ලබා ගත හැකිය.** (www.moe.gov.lk)
අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය - 2020 දෙසැම්බර් 04

5.1. තරගය අදියර දෙකකින් පැවැත්වේ.

- පළමු වටය - පළාත් තරග - 2021 මාර්තු 06 - 12
- අවසන් වටය - ජාතික තරගය - 2021 මැයි
- සහතික පත් ප්‍රදානය සහ විවිධ ප්‍රසංගය - 2021 ජූලි
- අනිවාර්ය සංගීත ඛණ්ඩ / ගීත වෙබ්ගත කිරීමේ දිනය - 2021 ජනවාරි

• පළමු තරග වටය පළාත් මට්ටමින් පළාත් අධ්‍යාපන කාර්යාලයේ සහයෝගීතාවයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වනු ලැබේ.

5.2 පළමු තරග වටය අදාළ පළාතේ පවත්වනු ලබන්නේ අවම වශයෙන් අයිතම 25ක් වත් තරගය සඳහා ඉදිරිපත්වන්නේ නම් පමණි. ඊට අඩුවෙන් ඉදිරිපත් වන අවස්ථාවලදී පළාත් දෙකක් ඒකාබද්ධව තරගය පවත්වනු ලැබේ.

5.3 පළාත් වටයේදී එක් එක් අයිතමය සඳහා පළමු ස්ථානය දිනාගත් සියලුම කණ්ඩායම් පමණක් ජාතික මට්ටමට සුදුසුකම් ලබන අතර ඊට අමතරව එම අයිතමයෙන් සහභාගිවන සියලුම පළාත්වල සියලුම කණ්ඩායම් එකට සලකා බලා ඒ අයිතමය සඳහා වැඩිම ලකුණු ලබාගත් තවත් කණ්ඩායම් දෙකක් ජාතික තරගය සඳහා සුදුසුකම් ලබයි.

## 6.0 තරග අයිතම

| | | | | | |
|---|---|---|---|---|---|
| 6.1 | | ගායනය | ඒකල | කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ (ගැහැණු/පිරිමි/මිශ්‍ර) | |
| 6.2 | | ගායනය | කණ්ඩායම් | ප්‍රාථමික / කණිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ / විවෘත (ගැහැණු / පිරිමි / මිශ්‍ර) | දෙන ලද ගීතය හා තම අභිමතය පරිදි වෙනත් ගීතයක් |
| 6.3 | | රෙකෝඩර් | ඒකල | කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ | |
| 6.4 | | පියානෝ | ඒකල | කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ | |
| 6.5 | | රෙකෝඩර් | සමූහ | කණිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ / විවෘත | |
| 6.6 | A1 / A2 / B | මෙලෝඩිකා | සමූහ | කණිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ / විවෘත | |
| 6.7 | | පර්කෂන් බෑන්ඩ් | සමූහ | ප්‍රාථමි(තූර්යවාදක කණ්ඩායම් සඳහා මෙලෝඩිකා වාදනය කළ හැක) | |
| 6.8 | | මිශ්‍ර වාද්‍ය භාණ්ඩ | සමූහ | කණිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ / විවෘත<br>-පියානෝ, ඉලෙක්ට්‍රොනික ඕගන්, ඉලෙක්ට්‍රික් ගිටාර්, හෝ පෙරදිග භාණ්ඩ කිසිවක් භාවිතා කළ නොහැක.<br>- සුසිර භාණ්ඩ (බ්‍රාස් වින්ඩ්) වර්ගයේ මෙවලම් භාවිතා කරන්නේ නම් එක් වර්ගයකින් එකක් බැගින් මිශ්‍ර භාණ්ඩ යොදා ගත හැකිය. | තම අභිමතය පරිදි තෝරාගත් එකිනෙකට වෙනස් සංගීත ඛණ්ඩ 02ක් |
| 6.9 | | ගිටාර් (Classical Style) | සමූහ | | |
| 6.10 | A1 /A2 | පියානෝ එකෝඩියන් | සමූහ | විවෘත | |
| 6.11 | | චේම්බර් (කුඩා කණ්ඩායම්) | සමූහ | | |
| 6.12 | ඉහළ මට්ටම A1 | | | විවෘත / පිරිමි / ගැහැණු / මිශ්‍ර | දෙන ලද ගීතය හා තම අභිමතය පරිදි වෙනත් ගීතයක් |
| | පහළ මට්ටම A1 | වින්ඩ් බෑන්ඩ් | සමූහ | විවෘත / පිරිමි / ගැහැණු / මිශ්‍ර | තම අභිමතය පරිදි එකිනෙකට වෙනස් ගීත 02ක් |
| 6.13 | A1 | බටහිර වාද්‍ය වෘන්දය | සමූහ | විවෘත (A1 යටතේ පමණක් ඉදිරිපත් විය යුතුය ) | දෙන ලද ගීතය හා තම අභිමතය පරිදි වෙනත් ගීතයක් |
| 6.14 | A1 / A2 / B | බටහිර නර්තන (මුල් නර්තනය හෝ නිර්මාණාත්මක නර්තනය) | සමූහ | • ප්‍රාථමික - වයස් කාණ්ඩයට සුදුසු වන ඕනෑම නර්තනයක්<br>• කණිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ / විවෘත | (බටහිර ගැමි නැටුම්, සහ පේලි නැටුම්) |

- නර්තනයට අවශ්‍ය සංගීතය සජීවීව හෝ සංයුක්ත තැටි ලෙස ද භාවිත කළ හැක.
- 2018 - 2019 වර්ෂයට ඉදිරිපත් කරන ලද නැටුම ම නැවත ඉදිරිපත් කිරීමෙන් වළකින්න.
- පාසල් ප්‍රසංගයකට සුදුසු පරිදි රංග වස්ත්‍රාභරණ යොදා ගත යුතු ය.
- ඇඳුම් පැළඳුම් සඳහා ලකුණු ලබා දීමක් නොවන හෙයින් පළාත් මට්ටමේ තරගවලදී අනවශ්‍ය ලෙස වියදම් කිරීමෙන් වළකින්න.

**7.0 තරඟයට යොදාගන්නා අනිවාර්ය ස්වර ප්‍රස්තාර**

7.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් අනිවාර්ය සංගීත කාණ්ඩ බාගත කරගත හැකි අතර වෙනත් පිටපත් භාවිතා කළ නොහැක. (**www.moe.gov.lk**)

7.2 අනිවාර්ය ගීතයට අමතරව ඔබ කැමති ගීතයක් ද ඉදිරිපත් කළ යුතුය. එය ඕනෑම පිටපතකින් ඉදිරිපත් කළ හැකි අතර තරගයට ඉදිරිපත්වන අයගේ කැමැත්ත පරිදි අවසාන වටයේදී වෙනත් ගීතයක් ද ඉදිරිපත් කළ හැකිය. (ජාතික මට්ටමේදී)

7.3 රෙකෝඩර්, වින්ඩ්බැන්ඩ් සහ ඕකෙස්ට්‍රා සඳහා අනිවාර්ය සංගීත කාණ්ඩය හැර වෙනත් සුදුසු තෝරාගත් සංගීත කෘතියක් ද ඉදිරිපත් කළ යුතුය.

7.4 ඔබේ කැමැත්ත අනුව තෝරාගන්නා ලද ගීතයට අදාළ සංගීත ස්වර ප්‍රස්ථාරවල පිටපතක් ද විනිශ්චය මණ්ඩලය වෙත ලබා දිය යුතුය.

7.5 ප්‍රාථමික අංශයේ ගායනා අයිතමයේ තම අභිමතය පරිදි තෝරා ගන්නා ලද ගීතය ක්‍රියාකාරකම් සහිත ගීතයක් විය යුතුය.

7.6 තරගය සඳහා සහභාගී වන සිසුන්ගේ නාම ලේඛනය විදුහල්පති මගින් සහතික කරවාගෙන රැගෙන ආ යුතුය. එක් එක් සිසුවා ඉගෙනුම ලබන පන්තිය ඒ ඒ සිසුවාගේ නම ඉදිරියෙන් වෙන වෙනම සඳහන් කළ යුතු අතර, ඒ ඒ සිසුවාගේ අත්සන ද නම ඉදිරියෙන් තැබිය යුතුය.

- ඉහත සඳහන් කර ඇති සියලු විස්තර නිවැරදිව ලබා නොදෙන කිසිදු පාසලකට මෙම තරගයට ඉදිරිපත්වීමට ඉඩදෙනු නොලැබේ.

**8.0 තරගයට ඉදිරිපත්වීම සඳහා සිසුන් රැගෙන ඒම.**

8.1. එක් අයිතමයක් සඳහා ඉදිරිපත්වන සිසුන් සංඛ්‍යාව 18ක් හෝ ඊට අඩු වූ විට ඔවුන් සමග ගුරුවරුන් 02ක් පැමිණිය යුතු අතර, ඊට අමතරව වැඩි වන්නා වූ සෑම සිසුන් 10ක් සඳහා ම අමතර ගුරුවරයකු බැගින් පැමිණිය යුතු ය.

**9.0 ගෙවීම**

9.1 මේ සඳහා ගුරුවරුන්ට හා සිසුන්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

**10.0 අයදුම්පත්‍ර යොමු කිරීම**

10.1 මෙහි දක්වා ඇති ලින්ක් මගින් **Online** ක්‍රමයට අයදුම්පත් සම්පූර්ණ කළ යුතුය. එක් පාසලක් විසින් ඉදිරිපත් කරනු ලබන අයිතම සියල්ලම එකම අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුවේ. **අයදුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනය 2020 දෙසැම්බර් 04 වේ.**

10.2 යම් තරග අයිතමයක් තරගයෙන් ඉවත්කර ගැනීමට අවශ්‍ය නම් ඒ බව දින 30කට පෙර ලිඛිතව දැනුම් දිය යුතු ය.
* ඉහත කොන්දේසි කඩකරනු ලබන අයදුම්කරුවන් සඳහා තරගයට ඉදිරිපත් වීම වසර 02ක් සඳහා තහනම් කෙරේ.

10.3 අසම්පූර්ණ අයදුම්පත්‍ර පිළිගනු නොලැබෙන බැවින් අයදුම්පත ඉතාමත් සැලකිල්ලෙන් සම්පූර්ණ කළ යුතු ය.

සටහන : **විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණයට විරුද්ධවන්නන් තරගයෙන් ඉවත් කිරීමට සිදු වේ. තවද මේ පිළිබඳව කිසිදු අභියාචනාවක් භාරගනු නොලැබේ.**

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

SPECIMEN APPLICATION FORM

## ALL ISLAND SCHOOLS WESTERN MUSIC & DANCE COMPETITION - 2021

Fill the form in block capital letters.

| | |
|---|---|
| Province :- | |

| | |
|---|---|
| Name of School :- | |

Write the name of school as given in the example "ANULA VIDYALAYA, NUGEGODA"

| | | |
|---|---|---|
| Category :- | | (A1 /A2 /B ) |

| | |
|---|---|
| Group :-<br>Primary/Junior/ Senior/ Open:- :- | |

√ (Tick) the cage.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Section Selected :- | Vocal | | Solo | | Choir | |
| Girls/ Boys/ Mixed | | | | | | |

| | Solo | Group |
|---|---|---|
| Recorder | | |
| Piano | | |
| Melodica | | |
| Accordion | | |
| Percussion Band | | |
| Mixed Instrumental | | |
| Guitar | | |
| Chamber | | |
| Wind ensemble | | |
| Orchestra | | |
| Dance | | |

| | |
|---|---|
| Name of Teacher :- | |
| Assisted by :- | |

| | | |
|---|---|---|
| Contact Number of teachers / in-charge :- | Tel. No. Fixed Line | Mobile Tel. No. |

Music Teacher

Principal

Date........................................... ***Each entry should be on a separate Application Form***